ජනාධිපතිවරයාට අප්‍රසාදය පළ කිරීම සදහා විපක්ෂය මඟින් ගෙන ආ යෝජනාව විවාදයට ගැනීමට අදාළව ස්ථාවර නියෝග අත්හිටුවීමේ යෝජනාව, මැයි 17, 2022 දින වැඩි ඡන්ද 51 කින් පාර්ලිමේන්තුවේදී පරාජයට පත්වූ බව මාධ්‍ය ඔස්සේ වාර්තා වී තිබිණි. ඒ සම්බන්ධයෙන් මැයි 18, 2022 දින ඉංග්‍රීසි පුවත්පත් සිරස්තල ඔස්සේ වාර්තා වී තිබූ ආකාරය මෙසේ දැක්විය හැක.

ජනපතිට අප්‍රසාදය පළ කිරීමට වන යෝජනාව විවාදයට ගැනීමට අදාළව ස්ථාවර නියෝග අත්හිටුවීමේ යෝජනාව පරාජය වේ/ප්‍රතික්ෂේප කෙරේ - The Morning, Dailymirror, Ceylon Today, The Island

ජනපතිට එරෙහි යෝජනාව පරාජය කෙරේ: මන්ත්‍රීවරුන් 68 ක් පක්ෂව සහ 119 ක් විපක්ෂව ඡන්දය දෙයි - Daily News

ඒ අනුව, මේ සම්බන්ධයෙන් වඩාත්ම නිරවද්‍ය පැහැදිලි කිරීමක් පාඨකයාට ලබාදෙන සිරස්තල ලෙසින් ඔබ තෝරාගන්නේ කුමන සිරස්තල ද?